# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1861/31 - 2014 මැයි මස 07 වැනි බදාදා - 2014.05.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාත් සභාවේ 2014 නාගරික කෘෂිකර්ම ප්‍රතිපත්තිය

බස්නාහිර පළාත් සභාව විසින් 2011 අගෝස්තු මස 17 වැනි දින අනුමත කරන ලදුව, බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2011 සැප්තැම්බර් මස 21 වැනි දින අනුමැතිය ලබා දී ඇති, බස්නාහිර පළාත් සභාවේ නාගරික කෘෂිකර්ම ප්‍රතිපත්තිය 2014 මැයි මස 23 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බව බස්නාහිර පළාත් සභාවේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍ය නීතිඥ උදය ප්‍රභාත් ගම්මන්පිල වන මම මෙයින් නියම කරමි.

නීතිඥ උදය ප්‍රභාත් ගම්මන්පිල,
බස්නාහිර පළාත් කෘෂිකර්ම,
ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග,
කර්මාන්ත, පරිසර, සංස්කෘතික හා
කලා කටයුතු පිළිබඳ අමාත්‍ය.

2014ක් වූ මැයි මස 05 වැනි දින,
කොළඹ 07, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
තැ. පෙ. 566 දරන ස්ථානයේ පිහිටි බස්නාහිර
පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන,
සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර,
සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

**නාගරික කෘෂිකර්ම ප්‍රතිපත්ති ප්‍රකාශය - බස්නාහිර පළාත**

1. සෞඛ්‍ය සම්පන්න නාගරික ජනතාවක් බිහිකිරීම සඳහා, නව හා සම්ප්‍රදායික තාක්ෂණය යොදා ගැනීම තුළින් පරිසර හිතකාමීව නාගරික කෘෂිකර්ම ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම හා එමගින් ප්‍රජාවගේ ආදායම හා ජීවන තත්ත්වය නගා සිටුවීම.

2. රාජ්‍ය, පෞද්ගලික, රාජ්‍ය නොවන ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මෙන්ම ප්‍රජා සංවිධාන හා පුද්ගලයින් සම්බන්ධ කරගනිමින් නාගරික කෘෂිකර්ම කටයුතු ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් ශක්තිමත් කිරීම.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. නාගරික කෘෂිකර්මයේ දී පරිසර හිතකාමී ක්‍රියාවන් වන කැලිකසල ප්‍රතිචක්‍රීකරණය හා වැසි ජලය උපයෝගී කරගැනීම සිදුකිරීම, පාවිච්චි කරන ලද ජලය පිරිසිදු කොට නැවත යෙදවීම සහ ජලය වඩාත් කාර්යක්ෂමව භාවිත කිරීම.

4. නාගරික කෘෂිකර්ම කටයුතු ප්‍රවර්ධනය සඳහා නාගරික ගෘහ ආශ්‍රිත පරිශ්‍රයන්, ආයතනික පරිශ්‍රයන් හා රජය සතු භාවිතා නොකරන භූමිවල තිරස් හා සිරස් අවකාශයන් ඵලදායීව උපයෝගී කර ගැනීම.

5. නාගරික කෘෂිකාර්මික කටයුතු හා ව්‍යවසායකත්වය සඳහා විවිධ ප්‍රදානයන්, ණය පහසුකම් හා රක්ෂණ ක්‍රම ඇති කිරීම.

6. නාගරික කෘෂිකර්මය කෘෂි සංචාරක ව්‍යාපාරය වැනි ක්ෂේත්‍ර සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම.

7. ප්‍රාථමික, ද්විතීක හා තෘතීක අධ්‍යාපන ආයතනවල විෂයමාලා සඳහා නාගරික කෘෂිකර්මය ඇතුළත් කිරීම.

8. නාගරික කෘෂිකර්ම ප්‍රවර්ධනය සඳහා දේශීය සහ විදේශීය දැනුම හා පළපුරුද්ද හුවමාරු කර ගැනීමට හා ආකල්ප සංවර්ධනය කිරීමට පහසුකම් සැලසීම.

9. නාගරික කෘෂිකාර්මික ප්‍රවර්ධනයේ තිරසාරභාවය සහ උන්නතිය උදෙසා නව පර්යේෂණ සඳහා දිරිගැන්වීම හා පහසුකම් සැලසීම.

10. නාගරික කෘෂිකර්මය ප්‍රවර්ධනය සඳහා මාධ්‍යය ඵලදායීව යොදා ගැනීම.

05-595

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.